# 多言語情報コーナー　　　　　　　　　　（令和５年　４月号）

## 1.  2023 අප්‍රේල් 5 වැනි දින සිට කාලය දිර්ගකර ඇති කවුළු විවෘත වන දිනයන් පිලිබඳව

තොචිගි නගර කාර්යාලය විසින් නගර වැසියන් විසින් වැඩිවශයෙන් භාවිතා කරන කවුළු වල කාලය දීර්ග කරනු ලැබේ.අප්‍රේල් මස සිට තොචිගි ප්‍රධාන නගර කායීාලය සතියේ සෑම බදාදා දිනයේද වෙනත් සෑම ශාකා කාර්යාල සෑම මස දෙවැනි බදාදා හො වෙනත් දිනයන්හිදීද මෙය සිදුකල හැක.තොචිගි නිශිකතා ශාකා කාර්යාලය මගින් කලින් වේලාව වෙන්කිරිමකින් තොරව මෙම සේවාව ලබාගත හැක.

විවෘත කෙරෙන කවුළු අතර ප්‍රධාන නගර කාර්යාලයේ මහජන ජීවිත අංශය ,සෞඛ්‍ය රක්ෂණ සහ විශ්‍රාම වැටුප් අංශය, බදු කටයුතු අංශය  සහ එක් එක් සාමාන්‍ය ශාඛා ප්‍රාදේශීය සංවර්ධන ප්‍රවර්ධන අංශය වේ.

කාලය දිර්ගකරන මෙම කවුළු තුල ලබාගතහැකි සේවාවන් ලෙස මහජන ජීවිත අංශය සහ ප්‍රාදේශීය සංවර්ධන ප්‍රවර්ධන අංශය මගින් පුද්ගල ලියාපදිංචි කිරීම,පවුලේ සාමාජිකයන් පිළිබඳ ලිපිලේකන ලබා දීම,පදිංචිය මාරුවීම් ආදිය භාර ගැනීම,my number කාඩ් ලබාදීම ආදිය වේ.

සෞඛ්‍ය රක්ෂණ සහ විශ්‍රාම වැටුප් අංශය සහ ප්‍රදේශ සංවර්ධනය ප්‍රවර්ධන අංශය මගින් රක්ෂණ සහ  විශ්‍රාම වැටුප් පිළිබඳ අරමුදල් ලබාගැනීම් සහ ගෙවීම්   ආදිය වේ.

බදු කටයුතු අංශය සහ ප්‍රාදේශීය සංවර්ධනය ප්‍රවර්ධනය අංශය මගින් බදු ගෙවීමේ පිළිබඳ සහතික, ආදායම් සහතික නිකුත් කිරීම, අදායම් බදු සහතික නිකුත් කිරීම සහ අදායම් බදු ගෙවිය යුතු නොවෙන සහතික නිකුත් කිරීම ආදිය සිදුකරනු ලැබේ.

මීට අමතරව, නගර බදු ආදිය පිළිබඳ කටයුතු සහ බදු ගෙවීම් පත්‍ර නැවත නිකුත් කිරීම ආදිය සිදුකරනු නොලැබේ.

කාලය දිගුකර ඇති වේලාවන වන්නේ සවස 5:15 සිට 7:00 දක්වා වේ.
"කරුණාකර    මෙය  භාවිතා කරන්න.

## 2. ජාතික විශ්‍රාම වැටුප් රක්ෂණ වාරිකය පිළිබඳ දැනුම්දීම

ජාතික විශ්‍රාම වැටුප් රක්ෂණ වාරිකය සෑම වසරකම සංශෝධනය කෙරේ. 2023 වසර සඳහා මාසික ගාස්තුව යෙන් 16,520 ක් වේ. අත්පිට මුදල් මගින් ගෙවන අය වෙනුවෙන් අප්‍රේල් මුල ජාතික විශ්‍රාම වැටුප් කාර්යාලය මගින් ගෙවීම් පත්‍රිකා එවනු ලැබේ. සෑම මාසයකම රක්ෂණ වාරිකය ඊළඟ මාසයේ අවසාන දිනය වන විට ගෙවිය යුතුය.

ජාතික විශ්‍රාම වැටුප් රක්ෂණ වාරිකය යනු ජපානයේ වෙසෙන වයස අවුරුදු 20 හෝ ඊට වැඩි වයස අවුරුදු 60 හෝ ඊට අඩු ජපානය තුල පදිංචිය තහවුරු කරන කාඩ්පතක් ඇති අය මේ සඳහා ඇතුල්වීමට සුදුසුකම් ලැබේ.

ජාතික විශ්‍රාම වැටුප් රක්ෂණ වාරිකය වසර 10කට වැඩි කාලයක් ගෙවා ඇති අයෙකු විශ්‍රාම වැටුපට හිමිකම් කියනු ලැබේ.

ඔබ අතරමගදී ඔබේ මව් රටට ආපසු යාමට සිදුවුවහොත්, ඒ පිළිබඳ ඇති ක්‍රියාපටිපාටිය සම්පූර්ණ කල අය වෙනුවෙන් අදාල වාරික ගෙවා ඇති කාලසීමාව අනුව යම් මුදලක් ආපසු ලබා දෙනු ඇත.

මීට අමතරව, ඔබ ශිෂ්‍යයාවක් නම් ඔබගේ ආදායම යම් ප්‍රමාණයකට වඩා අඩු නම්, ඔබ ඉල්ලීමක් කළහොත්, ජාතික විශ්‍රාම වැටුප් රක්ෂණ වාරික ගෙවීම කල් දමනු ලැබේ. ජපන් ජාතික නොවන සිසුන් ද මේ සඳහා සුදුසුකම් ලබයි.

අයදුම් කිරීමට කැමති අය ජාතික විශ්‍රාම වැටුප් රක්ෂණ ආයතනය විසින් එවනු ලැබන ගෙවීම් පත,my number කාඩ් පත, විශ්‍රාම වැටුප් රක්ෂණයට අදාල අංකය සහිත ලියවිල්ලක් යන කුමනහෝ එකක් සමග ඔබගේ ශිෂ්‍ය හැඳුනුම්පත හෝ ඔබ පාසලට ඇතුලත් වීමේ ශිෂ්‍ය හැඳුනුම්පත රැගෙන තොචිගි ප්‍රධාන නගර කාර්යාලයට හෝ ශාකා කාර්යාලයක රක්‍ෂණ සහ විශ්‍රාම වැටුප් අංශයේ කවුළුවෙන් අයදුම් කල හැක.

2022 වෙනි අවුරුද්දේ ශිෂ්‍ය බදු නිදහස් කිරීමක් අනුමත වන අතර 2023 අවුරුද්දේද පාසල් යන ශිෂ්‍යයාවන් වෙත විශ්‍රාම වැටුප් රක්ෂණ කල් දැමීමේ පත්‍රිකාවක් ජාතික විශ්‍රාම වැටුප් රක්ෂණ ආයතනය විසින් එවනු ලැබේ.එම පත්‍රිකාව නැවත එවීම මගින් ඔබට කවුළුවේදී අයදුම් කිරීමට අවශ්‍ය නොවේ.

## 3. තොච්ගි වැඩබිම් කටයුතු පිළිබඳ කාර්යාලයේ තොරතුරු

තොච්ගි යමතෝ නගරයේ ප්‍රාන්තයට අදාල සනෝ පාරේ, විදුලි කණු ඉවත් කිරීම සම්බන්ධ මාර්ග වැඩිදියුණු කිරීමේ කටයුතු සිදුකරනු ලැබේ. ඉදිකිරීම් කලාපයේ ඇති යමතෝ නගර විදුලි සංඥා ස්ථානය හෙවත් තොච්ගි අශිකගා බැංකු ශාකාව සහ ස්ටාර්බැක්ස් විදුලි සංඥා ස්ථානයේ සිට කෝරයි පාලම දක්වා අතර ඇති මීටර් 180 පමණ කොටස තුල 2023 මාර්තු මස සිට එම මාර්ගයේ එක් මන්තිරුවක් පමණක් භාවිතා වේ.

මෙය වසර කිහිපයක් ගතවන ඉදිකිරීම් ව්‍යාපෘතියක් බැවින් දීර්ඝ කාලයක් වැඩබිමේ කටයුතු කිරීමේදී සිදුවන ක්‍රියා පටිපාටිය හේතුවෙන් මෙම මාර්ගය භාවිතා කරන අයට අපහසුතාවයක් සහ ව්‍යාකූලත්වයක් ඇති විය හැකි අතර ඒ පිළිබඳව කණගාටුව ප්‍රකාශ කරනු ලැබේ.ඒ පිළිබඳ ඔබගේ සහයෝගය ලබා දෙන මෙන් ඉල්ලා සිටිමු.

මීට අමතරව, පළමු පන්තියේ kyukasen මාර්ගයේ Nagano ගඟ ආපදා වැලැක්වීමේ පියවරක් ලෙස තොච්ගි ඕහිරා නගර එනොමොතෝ කලාපයේ අංක 2098 දරන මාර්ගයේ දෙපස සම්බන්දකිරීමේ වැඩකටයුතු සිදු කරනු ඇත.

ඉදිකිරීම් කාලය2023 වසරේ අප්‍රේල් මාසයේ සිට 2026 වසරේ මාර්තු දක්වා වසර තුනක පමණ කාලයක් සඳහා සැලසුම් කර ඇති අතර, එම කාලය තුල එම කොටස සම්පූර්ණයෙන්ම වසා තබනු අතර වාහන, බයිසිකල් සහ පදිකයින්ටද අවහිර වනු ඇත, එබැවින් කරුණාකර වෙනත් මාර්ගයක් භාවිතා කරන්න.

ප්‍රදේශවාසීන් සහ එම පාලම දෙපස සිටින ඔබ සැමට සිදු වූ අපහසුතාවය සහ ව්‍යාකූලත්වය පිළිබඳව අපි සමාව අයදින අතර ඔබගේ සහයෝගය අපි අගය කරමු.